# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2363/89 – 2023 දෙසැම්බර් මස 23 වැනි සෙනසුරාදා – 2023.12.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/255.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.14 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මඟින් විසඳීම සඳහා හපුගල, බටුවන්තුඩාව පාර, යුනිවර්සල් සිටි, අංක 77 ලිපිනයෙහි පදිංචි එම්. ජී. උජිතා රසාංගනී ඇතුළු සේවකයින් තිදෙනා සහ ගාල්ල, පහළ ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක A/76/2022 දරන ප්‍රදානය 2023.06.06 දිනැති හා අංක 2335/07 දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වන වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2023.11.03 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 041117 – 18 (2023/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2023.11.03

**බේරුම්කරණ යොමු අංකය A/76/2022**

සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කම්කරු කොමසාරිස්තුමා, කාර්මික සම්බන්ධතා අංශය වෙත ඉදිරිපත් කරන ලද අංක දප/මාසංඅ/A/76/2022 හා 2023.10.25 දිනැති ලිපිය හා සබැඳේ.

ඉහත සඳහන් ලිපියේ ඡේද අංක 03 අනුව 2019 ජූලි මස 01 වැනිදා සිට ඉල්ලුම්කාරියන් විසින් එතෙක් ලබාගත් මාසික වැටුප වන 14,280/- ක වැටුපේ පිහිටුවා, ප්‍රදානය ලබාදෙන තෙක් 2023 පෙබරවාරි මස දක්වා අඩුකරන ලද මුදල සමග මෙම කාලයට හිමි වැටුප් වර්ධක සමග ගෙවීමට සහ ඒ අනුව ගණනය කරන ලද සේවා අර්ථසාධකය සහ සේවා භාරකාර අරමුදල ගෙවීමටත්ය. ඒ සමග අතිකාල දීමනාව ද ගණනය කර ගෙවිය යුතුය.

ඡේද අංක 04 යටතේ ඉල්ලුම්කරුවන්ට හිඟ වැටුප් සකස් කරන ලද්දේ ඉල්ලුම්කරුවන්ගේ මාසික වේතනයෙන් අඩුකරන ලද රුපියල් 960/- වශයෙන් ගණනය කර එම කාලසීමාවට හිමි සේවා අර්ථසාධක අරමුදලටත් සේවා භාරකාර අරමුදලටත් ගණනය කිරීමෙනි. ඉල්ලුම්කරුවන් කරන ලද අතිකාල සේවා සම්බන්ධයෙන් කාර්යාලයේ ඇති පැමිණීමේ ලේඛන පරීක්ෂා කිරීමෙන් මෙය සනාථකර ගත හැකිය.

මෙම ඉල්ලුම්කරුවන් පිහිටුවිය යුත්තේ ඔවුන් විසින් අවසානවරට ලබාගත් රු. 14,280/- ක වැටුප් තලයේ පිහිටුවා ඔවුන්ට හිමි වැටුප් වර්ධක ලබාදී ගණනය කර නිසි වැටුප් පියවරේ තැබීමය.

මෙයට - විශ්වාසී,

කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්,
බේරුම්කරු.

EOG 12 – 0369

---

මගේ අංකය: IR/COM/02/2021/154.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2355/17 දරන හා 2023.10.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 12, මිරානියා වීදිය, බී.සී.සී. පරිශ්‍රය, අංක 21, ප්‍රසම්පාදන අංශය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවහි ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා මයා සහ කොළඹ 12, මිරානියා වීදිය, බී.සී.සී. පරිශ්‍රය, අංක 21, ප්‍රසම්පාදන අංශය (වර්තමාන ලිපිනය - අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10) හි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A73/2022 දරන හා 2023.09.06 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A73/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2024.10.24 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**අ ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 51 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
අංක 257,
සිරිධම්ම මාවත,
කොළඹ 10.

දිනය : 2023 නොවැම්බර් මස 16 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් තුමා,

2023 ඔක්තෝබර් මස 24 දිනැති අංක 2355/17 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, අංක A/73/2022 දරන ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව බැඳී සිටින්නා වූ ද, 2023.09.06 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එන්. පී. ජිනසේන,
සාමාන්‍යාධිකාරි,
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව.

*පිටපත* : (අනෙක් පාර්ශ්වය) - ආර්. වයි. ජී. එස්. ගයාන් යාපා

1. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්ති බලන්න)

2. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද, යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 12 – 0370

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.